# හෙළ උරුමයේ දුස්සීල වාහන

සුනන්ද දේශප්‍රිය

දැන් බලන විට හෙළ උරුමයේ හාමුදුරුවරු දුස්සීල නැත. දුස්සීල වන්නේ ඔවුන් ලබා ගත් වාහන ය. මන්ද යත් කොතැනක හෝ වාහනවලට අදාළව දුස්සීලකමක් සිදුව ඇති බව සක් සුදක් සේ පැහැදිළි නිසා ය.

මුලින්ම අප දැක්කේ හෙළ උරුම පාර්ලිමේන්තු නායක රතන හිමි ප්‍රසිද්ධියේම තමන් තීරුබදු රහිතව ලබා ගත් වාහන විකුණූ බව පිළිගැනීම ය. ඒ බව අප දුටුවේ සිරස රූපවාහිනියේ ය. එය නැතැයි කීමට බැරි වීඩියෝ සාක්ෂියකි. එහිමියන් කීවේ එම මුදල වාහන ගැනීමට සහ සිය පක්ෂයේ නඩත්තුව සඳහා යෙදවූ බව යි.

දෙවනුව අප දුටුවේ තමන් වාහන විකුණුවේ නැතැයි හෙළ උරුම නායක පාර්ලිමේන්තු මංත්‍රී ආචාර්ය මේධානන්ද හිමි කියන අන්දම ය. එයද සිරස රූපවාහිනියෙන් ම දුටුවෙමු. එහිමියන් කීවේ තමන් සිය වාහන පක්ෂයේ ගිහි බවතුන්ට දී ආධාර ලබා ගත් බව යි.

ඊළගට හෙළ උරුමයේ ගිහි නායකයකු වන හිටපු නියෝජ්‍ය පොලිස්පති කොටකටදනිය මහතා ය. ඔහු රාවය පුවත්පතෙහි ජයසිරි විතාන සමග සම්මුඛ සාකච්ඡාවක දි (22.07.2007) හෙළ උරුමය සිය තීරුබදු රහිත වාහන ව්‍යාපාරිකයින්ට දී මුද්ල ලබා ගත්බව කෙලින්ම පිළි ගත්තේ ය. ඔහු එහිදී කිවේ මංත්‍රී හාමුදුරුදුරුවන් සැමට ලක්ෂ 30 ගනනේ වෙනත් වාහනයක් ගැනීමට එම මුදලින් බෙදා දුන් බව ය. මෙම බෞද්ධ භික්ෂුන් වැඩි මිල සුඛෝපභෝගී වාහන තීරුබදු රහිතව ලබා ගත්තේ සිය ප්‍රයෝජනය සඳහා නොව විකිණිම සඳහා බව ඉන් පැහැදිළි ය.

අවසාන ජවනිකාව හෙළ උරුමය ප්‍රචාරක ලේකම් නිශාන්ත මහතාගෙනි. ඔහු දිනපතා ලංකාදීප පුවතපතෙහි අසෝක ජයතුංග සමග සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වෙමින් කීවේ (23.07.2007) හෙළ උරුමය වාහන විකුණුවේ නැති බව යි. ඔහු කොටකදෙනිය මහතාගේ ප්‍රකාශ පිළිගන්නේ නැත. නමුත් දැන් එම තීරුබදු රහිත වාහන සිය මංත්‍රී හාමුදරුවන් ලග නැති බව පිළි ගනී.

දැන් ඒ තීරුබදු රහිතව ගෙන් වු වාහන පාවිච්චි කරන්නේ කව්ද? හෙළ උරුමය පිළිතුරු දිය යුතු ප්‍රශ්නය එය යි. මහජනයාට වැඩි සේවයක් ඉටු තිරීම පිණිස ලබා දෙන තීරුබදු රහිත වාහන විකුණාගෙන කෑම බෞද්ධ කමද? දුස්සීලකමක් ද?

මෙරට දේශපාලන ක්‍රමයේ ජරාජීර්න බව පෙන්වන මෙම තීරුබදු රහිත වාහන ජාවාරම කිසිවකුට රහසක් නොවේ. කුමන වචන වලින් වසං කිරීමට උත්සාහ කළත් දැන් හෙළ උරුමය ද වැටී සිටින්නේ එම ජරා ගොඩටම ය.

හිටපු පොලිසිපතිවරයකු වන කොටකදෙනිය මහතා රාවයට දුන් සම්මුඛ සාකච්ජාව කියවීමට අවස්ථාවක් ඔබට නොලැබුනේ නම් දැන්වත් එය පෙරළා බලන්න. ශ්‍රී ලංකාවේ නීතියේ පාලනය බල්ලාට ගොස් ඇති සැටි ඉන් පෙනේ. ඔහු ප්‍රසිද්ධියේ ම කියන්නේ මෙම වාහන විකුණු බව තමන් අධිකරණය හමුයේ නොකියන බව යි! අනෙත් අතට හෙළ උරුම හාමුදරුවරු වාහන ජාවාරම ගැන කියන්නේ අතේ පැලවෙන බොරු ය. හෙළ උරුම ජනාධිපති අපේක්ෂකයා විමට සිටි හිටපු නියෝජ්‍ය පොලිස්පති නොකියා කියන්නේ තමන් නීතිය නොසළකන බව කියයි.

ජාතිකවාදී පිරිස් සාමාන්‍යයෙන් අවංක යැයි සිතීමක් තිබේ. හෙළ උරුම ජාතිකවාදින් දේශපාලන මඩ ගොහොරුවේ පිනුම් ගසමින් දැන් පෙන්වා දෙන්නේ ඒ සිතීම වැරදි බව යි.

මංත්‍රී දේශපාලනය ජාවාරමක් බවට පත්කිරීමේ ගෞරවය හිමිවන්නේ ජේ.ආර්. ජයවර්ධනට ය. ඔහුගේ අරමුණ වූයේ සමාජය සහ දේශපාලනය සහමුලින්ම වානිජකරණය කිරීම යි. ඔහු සිය මංත්‍රීන් යොදා ගත්තේ ව්‍යවස්ථා සභාවක් ලෙස නොව විපක්ෂය පාගාදැමීමේ සහ බලහත්කාරය ජය ගැන්වීමේ කැලෑ නීතිය රජ කරවීමට ය.

එම පිළිවෙතෙහි ම විපාකයන් ලෙස දකුණේ ද උතුරේ ද සන්නද්ධ අරගල ශක්තිමත් විය. එම පසුබිම පාර්ලිමේන්තු මංත්‍රීවරුන්ගේ වරප්‍රසාද තව තවත් ඉහළ යෑමට හේතු විය.

එක් අපූරු උදාහරණයක් නම් 1988 - 90 යුගයේ ජවිපෙ භීෂන දේශපාලනය නිසා දුර බැහැර සිටින මංත්‍රීවරුන්ට සිය දරුවන් කොළඹ පාසැල් වලට ඇතුල් කිරීමට දෙන ලද විශේෂ අවසරය පාවිච්චි කරමින් අද ජවිපෙ මංත්‍රිවරුන් ම සිය දරුවන් කොළඹ සුපිරි පාසැල්වලට ඇතුළත් කර ගැනීම යි.

පාර්ලිමේන්තු මංත්‍රීන්ට වසර 5ක ධුර කාලකට පසු විශ්‍රාම වැටුපක් ලැබෙන නීතිය ගෙන ආවේ ජේ.ආර්.  ය. එම වරදාන පිළිවෙත අද කොතරම් ඉදිරියට ගොස් ඇත් ද යත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ සියළු දෙනාම වාගේ අද ඇමැතිවරුන් ය. පක්ෂ මාරුකර ආණ්ඩු පක්ෂයට එන විපක්ෂ මංත්‍රීන් සියල්ලන්ට ම ඇමැතිකම් පිරි නැමෙන්නේ ද වරදාන ලෙස ය.

මිලියන 19 ජනගහනයක්  සිටින මෙරට ඇමැති මංඩලය 108 දෙනෙකු සිටින්නේ ඒ නිසා ය. ඇමැතිවරයකුගේ මාසික වැටුප රු.65,000කි. ගෙවල් කුලිය රු.100,000කි. මාසික ඉන්ධන වියදම රු.75,000කි. දුරකථන වියදම රු. 25,000කි. ඇමැතිවරයකුට ලේකම්වරු හතර දෙනෙක් සිටින අතර ඒ සියළු දෙනාට ම වාහන සැපයේ.

(ජනගහණය මිලියන 370ක් වන කැනඩාවෙහි ඇමැතිවරු 31කි. ජනගහණය මිලියන 1000ක් වන ඉන්දියාවෙහි ඇමැතිවරු 20කි. ජනගහණය මිලියන 150ක් වන රුසියාවෙහි ඇමැතිවරු 31කි. ජනගහණය මිලියන 150ක් වන බංගලිදේශයෙහි ඇමැතිවරු 22කි.
ජනගහණය මිලියන 274ක් වන ඇමෙරිකාවෙහි ඇමැතිවරු 15කි.)

තීරුබදු රහිත වරදාන සැපයීම ආරම්භ වූයේ ද ජේ.ආර්. කාලයේ සිට මෙම වරදාන පිළිවෙතෙ හි  එක් පියවරක් ලෙස ය. පාර්ලිමේන්තු මංත්‍රිවරුන්ට පිරි නැමෙන අති විශේෂ වරප්‍රසාද අහෝසි කිරීමට අද කිසිම දේශපාලන පක්ෂයක් ඉල්ලා සිටින්නේ නැත.

අප හෙළ උරුමයට පමණක් දොස් කීමෙන් පළක් නැත්තේ ඒ නිසා ය. වරද ඇත්තේ ක්‍රමයේ නිසාය. හෙළ උරුමය ද දැන් එම දූෂනයේ ම ගිලී ඇත. අන් සියළු දේශපාලන පක්ෂ ද අඩු වැඩියෙන් මෙම වරාදාන දූෂන දේශපාලන සංස්කෘතියේ කොටස්කැරුවන් ය.

කණගාටුවට කරුණ වන්නේ ඉන් ගොඩ ඒමට දැරෙන කිසිදු පරිශ්‍රමයක් පේන මායිමක නැතිකම ය.